**වියළි කලාපීය නාගරික ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2477 - එස්ආර්අයි/2977 - එස්ආර්අයි, ප්‍රදාන අංක 0129/130 එස්ආර්අයි) 2014**

---

වියළි කලාපීය නාගරික ජලය හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 ජුනි 29 දින එළඹි අංක 2477 එස්ආර්අයි(එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය ,අංක 0129/0130 එස්ආර්අයි(එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුම හා 2013 පෙබරවාරි 13 දින එළඹි අංක 2977 - එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය හා ප්‍රදාන ගිවිසුම් අනුව එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන හා ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු පළාතේ මන්නාරම හා වවුනියා දිස්ත්‍රික්ක සහ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය හා හලාවත ඇතුළත් ශ්‍රී ලංකාවේ වයඹ වියළි කලාපයේ නාගරික ජනතාවගේ භෞතික සුබසාධනය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ සංශෝධිත මුළු පිරිවැය රු.මිලියන 19,165 කට සමාන එජඩො මිලියන 163.33 ක් වූ අතර ඉන් රු.මිලියන 11,809 කට සමාන එජඩො මිලියන 99.78 ක් හෙවත් සියයට 61.09 ක් ණයක් ලෙස සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබූ අතර රු.මිලියන 2,649 කට සමාන එජඩො මිලියන 23.22 ක් හෙවත් සියයට 14.22 ක් ප්‍රදානයක් ලෙස සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ජල මූල්‍යායන හවුල්කරු පහසුකම සඳහා නෙදර්ලන්ත භාර අරමුදලෙන් (NTF) රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 2 ක් හෙවත් සියයට 1.22 ක ප්‍රදානයක් කිරීමටද ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබූ අතර ඉතිරි රු.මිලියන 4,479 කට සමාන එජඩො මිලියන 38.33 ක් හෙවත් සියයට 23.47 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමටද එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 නොවැම්බර් 13 දින ආරම්භ කරන ලද අතර 2013 ජුනි 30 වන විට නිමකිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණි. පසුව, සිවිල් වැඩ සහ උපකරණ සඳහා යෙදවුම් අවශ්‍යතාවයන් වැඩිවීම හා එම අතිරේක පිරිවැය පිළිබඳ විස්තරාත්මක සැලසුමේදී ඇස්තමේන්තු කරන ලද බදු හා ගාස්තු වැඩිවීම හේතුවෙන් 2012 දෙසැම්බර් 18 දින එජඩො මිලියන 50 කින් ව්‍යාපෘතියේ මුළු පිරිවැය වැඩිකර තිබූ අතර එම අතිරේක පිරිවැයෙන් රු.මිලියන 4,988 කට සමාන එජඩො මිලියන 40 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 1,247 ට සමාන එජඩො මිලියන 10 සැපයීමට ශ්‍රී ලංකා රජය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය ද 2016 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයෙන් ලැබුණු මුදල් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්වෙන මුදල රු. 26,817,487 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍ය ගාස්තු ලෙස ණය මුදලෙන් අයකරගන්නා ලද රු.33,083,958 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

----------------------------------------------------

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වගන්තිය අනුව, රු.මිලියන 5 කට අඩු නොවන කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. තවද ටෙන්ඩරය පිරිනැමීමෙන් පසුව දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය සමඟ කටයුතු කරන කොන්ත්‍රාත්කරු මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

2.2.3 ව්‍යාපෘති අරමුණුවලට පරිබාහිරව අරමුදල් උපයෝජනය කිරීම

---------------------------------------------------------------------

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා සේවය කරන සේවකයන් දෙදෙනෙකුට ව්‍යාපෘතිය විසින් පාරිශ්‍රමික ගෙවා තිබූ අතර එම සේවකයින් සඳහා 2014 දෙසැම්බර් 31 දක්වා දරන ලද මුළු පිරිවැය රු.2,085,636 ක් විය.

2.2.4 පූර්ව විගණනයෙන් පෙන්වා දෙන ලද නිරවුල් නොවූ කරුණු

-------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වවුචර් සහ අදාළ ආධාරක ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2008 වර්ෂය තුළදී රු.මිලියන 7.8 ක්වූ ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් දරනලද වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. මෙම තත්ත්වය මාගේ පෙර විගණන වාර්තාවලින් නැවත නැවත පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල ඉදිකිරීම් උපකරණ, ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය සඳහා එජඩො මිලියන 57 ක් වෙන්කර තිබුණද, 2009 සිට 2013 දක්වා වර්ෂ තුළ ඒ සඳහා රු.12,213,794 ක් වූ ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝජනය කර තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය සහ ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ - ණය | | | | | | | |
| 2477 | 59.78 | 6,820 | | 13.87 | 1,803 | 25.23 | 3,281 |
| 2977 | 40.00 | 4,989 | 2,345 | 6.52 | 848 | 6.80 | 888 |
| උප එකතුව | 99.78 | 11,809 | | 20.39 | 2,651 | 32.03 | 4,169 |
| ආ ස බැ - ප්‍රදාන | | | | | | | |
| 129 | 23.22 | 2,649 | | 4.70 | 613 | 10.33 | 1,343 |
| 130 | 2.00 | 228 | 650 | 0.26 | 34 | 1.45 | 189 |
| උප එකතුව | 25.22 | 2,877 | | 4.96 | 647 | 11.78 | 1,532 |
| ශ්‍රී ලංකා රජය - උප එකතුව | 38.33 | 4,479 | 680 | 5.00 | 650 | 12.66 | 1,656 |
| මුළු එකතුව | 163.33 | 19,165 | 3,675 | 30.35 | 3,948 | 56.47 | 7,357 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ජුනි 30 දිනට අපේක්ෂිත ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 113.33 ක් විය. කෙසේ වුවද කාර්යයන් ක්‍රියාත්මක කරවීමේ දුර්වල කාර්යසාධනය හා අවිධිමත් පිරිවැය ඇස්තමේන්තු කිරීම හේතුවෙන් , එම ඉලක්ක ඉටුකර ගැනීම සඳහාම ආරම්භක මුළු පිරිවැය සියයට 44 කින් වැඩි කරමින් එය එජඩො මිලියන 163.33 ක් ලෙස සංශෝධනය කිරීමට සිදුවී තිබුණි.

(ආ) උතුරු පළාතේ හා වයඹ පළාතේ සංවර්ධන කාර්යයන් 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 6,236 ක මුදලක් වෙන්කර තිබුණද, WTP/C&P/04A කොන්ත්‍රාත්තුව නිමකිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 1,105 ක් වටිනා (WTP/C&P/04B)

කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නොහැකි වී තිබුණි. එබැවින් අංක WTP/C&P/04B දරන කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ නිමකිරීම පිළිබඳව විගණනයේදී සැකසහිතය.

3.2 භෞතික ප්‍රගතිය

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි කාර්තුමය වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එයින් බැහැරවීම් හඳුනාගැනීමට හා අවශ්‍ය පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි කාලීන ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉහත සැලැස්ම ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ඵලදායී පාලන උපකරණයක් ලෙස උපයෝජනය කර තිබූ බවට නිරීක්ෂණය නොවීය.

(ආ) 2016 ජුනි 30 වන විට ව්‍යාපෘතිය නිමකිරීමට සැලසුම් කර තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 63 ක් හා සියයට 35 ක් විය. කෙසේවුවද 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 78 ක් අවසන් වී තිබුණි.

3.3 සනීපාරක්ෂක වැඩසටහන

-------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සනීපාරක්ෂක වැඩසටහනේ භෞතික ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉලක්කය | 2014 දෙසැම්බර් 31 දිනට ඉටුකර ගැනීම | ප්‍රතිශතය | මූල්‍ය ප්‍රකාශන අනුව දරන ලද පිරිවැය |
|---|---|---|---|---|
| | (සංඛ්‍යාව) | (සංඛ්‍යාව) | | රු. |
| හලාවත | 500 | 335 | 67 | 8,015,429 |
| පුත්තලම | 500 | 390 | 78 | 9,287,050 |
| මන්නාරම | 330 | 297 | 87 | 6,711,250 |
| වවුනියා | 500 | 199 | 35 | 3,389,750 |
| මුළු එකතුව | 1,830 | 1,221 | 64 | 27,403,479 |

ව්‍යාපෘති පරිපාලන අත්පොත (PAM) අනුව, පවුල් 1,830 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමට සැලසුම් කර තිබුණි. එහෙත් 2014 දෙසැම්බර් 31 දිනට සපයන ලද තථ්‍ය පහසුකම්, 1,221 ක් වූ අතර එය ඉලක්කයෙන් සියයට 66 ක් විය. සනීපාරක්ෂක වැඩසටහන සඳහා වෙන්කරන ලද ප්‍රදාන මුදල හා එහි වාර්ෂික වෙන්කිරීම ආදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය ඇගයීම් කළ නොහැකි විය. කෙසේවුවද, සනීපාරක්ෂක පහසුකම් 1,221 ක් සැපයීම සඳහා 2014 දෙසැම්බර් 31 දිනට දරන ලද පිරිවැය රු. 27,403,479 ක් විය.

ඉහත විශ්ලේෂණයට අනුව, වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශය අනෙකුත් ප්‍රදේශවලට වඩා අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

නිමකරන ලද වැඩවලට සමගාමීව සිදුකළ යුතු කොන්ත්‍රාත් දෙකක් වූ හලාවත ජල සම්පාදන යෝජනා ක්‍රමයේ HDPE සහ PVC විශේෂ නළ හා සවිකිරීම් සැපයීම හා එළීම - අදියර I (කොන්ත්‍රාත් අංකය PIPES/C/8A සහ නිම කිරීම් දිනය 2014 ජුනි 06) හා අදියර II (කොන්ත්‍රාත් අංකය PIPES/S/8B සහ නිම කිරීම් දිනය 2014 සැප්තැම්බර් 22) යන ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ මූලික වැඩ, නව පිරිසිදු කිරීම් පිරියත හා පිරිසිදු නොකළ ජලය ඇතුළත් කරගැනීම (කොන්ත්‍රාත් අංකය WIP/C&P/04A) පිළිබඳ භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට සියයට 3 ක් විය. ප්‍රධාන කොන්ත්‍රාත්තුව නිමකිරීමේ ප්‍රමාදය හේතුවෙන්, නිමකරන ලද අනෙක් ව්‍යාපෘති දෙක එහි දෝෂ වගකීම් කාලය ඉකුත්වීමට පෙර පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි. ප්‍රධාන කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2015 ජුනි 30 දිනට සියයට 16 ක් පමණක් වූ බව තවදුරටත් නිරීක්ෂණය විය.